ලිංගික අපයෝජනයක් හෝ ලිංගික අතවරයක් යනු, නීතියෙන් දඬුවම් ලැබෙනා වරදකි. එවැනි සිදුවීමක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී පවා, සිරස්තලය තුළ සිටම, එවැනි වරදක නිසි බරපතල භාවය පාඨකයා වෙතට සන්නිවේදනය කිරීම අවශ්‍ය නොවන්නේදැයි, පාඨක අපි විමසිය යුතු වේ.
පස්වන සහ එකොළොස්වන ශ්‍රේණියේ දැරියන් සම්බන්ධ ලිංගික අතවර සිදුවීම් දෙකක්, පුවත් වාර්තාවන් දෙකක සිරස්තල ඔස්සේ දැක්වී තිබූ අයුරු පහත පරිදි වේ.
* දිනමිණ (මාර්තු 21, 2023) - "ගුරුවරියගේ සැමියාගෙන් පහේ සිසුවියන්ට අමුතු පාඩමක්"
* (මාර්තු 06, 2023) - "ටෙක් සර්ගේ හාදුවෙන් රත්ගම ඉස්කෝලයක් රත් වෙයි"
ඔබ සිතන ලෙසට,
1) "හාදුවක්" නැතිනම් "අමුතු පාඩමක්" ලෙසින් සිරස්තල යෙදීම ඔස්සේ, ලිංගික අපයෝජනයක්/ලිංගික අතවරයක් සිදුව ඇති බවක් පාඨකයාට පැහැදිලිව හැඟී යන්නේ ද?
2) එසේ නොවන්නේ නම්, මෙම සිරස්තල ඔස්සේ, ලිංගික අපයෝජන වරදක් සැහැල්ලු කොට (trivialisation) නොදැක්වෙන්නේ ද?
3) එසේ නම්, මෙවැනි සිරස්තල ඔස්සේ, ලිංගික අපයෝජනයන් සමාජය තුළ සාමාන්‍යකරණය වීමට අනුබල නොලැබෙන්නේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!
මෙය Portia Merlyn Kemps සහ Manikya Kodithuwakku විසින් අප වෙත යොමු කරන ලදී.

